වගා ආධාර චක්‍රලේඛ අංක: 09

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක 349, ගාලු පාර,
කොළඹ 03.

1989.01.12 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

**1989 සංශෝධිත අලුතෙන් තේ වගා කිරීමේ ආධාර ක්‍රමය සමග රබර් ඉඩම්වල තේ වගා කිරීමේ සහනාධාර ක්‍රමය ඒකාබද්ධ කිරීම.**

1989 ජනවාරි 01 දින සිට අලුතෙන් තේ වගා කිරීමේ ආධාර ක්‍රමය පහත දැක්වෙන පරිදි සංශෝධනය කර ඇත.

1. වාරික හතර (04) කින් සහනාධාර මුදල් ගෙවීම
2. සහනාධාර මුදල සියලුම තේ වගා දිස්ත්‍රික්ක සඳහා හෙක්:/රු පි: 30,000/= ක් දක්වා වැඩි කිරීම.
3. රබර් උදුරා තේ වගා කිරීමේ සහනාධාර ක්‍රමය, 1989 සංශෝධිත අලුත් වගා ආධාර ක්‍රමය සමග ඒකාබද්ධ කිරීම. (තේ හැර වෙනත් සියලු වගාවන් සහිත ඉඩම් හෝ මුඩු ඉඩම් එකී ආධාර ක්‍රමය යටතට ගැනීම.)

02. සංශෝධිත ආධාර මුදල් පහත දැක්වේ.

| ආධාර කොටස | සියලු තේ වගා දිස්ත්‍රික්ක හෙක්/රු පි. 1988.12.31 දක්වා පැවති මුදල | | 1989 සංශෝධිත සහනාධාර මුදල |
|---|---|---|---|
| | අලුත් වගා | රබර් X තේ | |
| 1. උදුරා දැමීම | 1000 | 1000 | 1000 |
| 2. පස සංරක්ෂණය කිරීම | 4000 | 4000 | 4000 |
| 3. පස සාරවත් කිරීම | -- | 3000 | -- |
| 4. තේ වගා කිරීම | 12500 | 8000 | 19000 |
| 5. පළමු වසර තුළ නඩත්තු කිරීම | 2500 | 3000 | 6000 |
| 6. දෙවන වසර තුළ නඩත්තුකිරීම | 2500 | 3000 | -- |
| 7. තුන්වන වසර තුළ " | 2500 | 3000 | -- |
| එකතුව | 25000 | 25000 | 30000 |

03. 1989.01.01 දිනට පෙර නිකුත් කළ අලුත් වගා අවසර පත්‍ර පිළිබඳව ඉදිරි කටයුතු.

1989 ජනවාරි මස 01 වෙනි දින හෝ ඊට පසුව පවත්වන ක්ෂේත්‍ර පරීක්ෂණ අනුව ගෙවීම් නිර්දේශ කරන පරීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් වැඩි කරන ලද

(අ) එකී දින හෝ ඊට පසුව තේ වගා කිරීමේ වාරිකය සඳහා පවත්වන පරීක්ෂණ වෙනුවෙන් වැඩි කරන ලද ආධාර මුදල ගෙවිය යුතුය.

(ආ) එකී දින හෝ ඉන් පසුව පළමු වසර නඩත්තු කිරීමේ පරීක්ෂණ පවත්වන අවස්ථාවේදී එය අවසාන ගෙවීම් පරීක්ෂණයක් ලෙස සලකා ඊට පෙර පැවති සහනාධාර ක්‍රමය අනුව ගෙවීමට ඇති සියලුම නඩත්තු කිරීමේ වාරික එක්වර ගෙවිය යුතුය.

(ඇ) පැරණි ආධාර ක්‍රමය අනුව පළමු වසර නඩත්තු කිරීමේ වාරිකය සඳහා එකී දිනට පෙර පරීක්ෂණ පවත්වා ඇති හෝ ගෙවා අවසන් කර ඇති අවසර පත්‍ර වලට ඉහත දිනයට පෙර පැවති ආධාර ක්‍රමය අනුව ඉදිරි නඩත්තු කිරීමේ වාරිකය වෙනුවෙන් ගෙවිය යුතු මුදල පරීක්ෂණයකින් තොරව මාසයක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුය.

04. පැරණි රබර් X තේ ආධාර ක්‍රමය යටතේ කටයුතු කිරීම.

(අ) 1989.01.01 දින සිට රබර් උදුරා තේ වගා කිරීමේ සහනාධාර ක්‍රමයද, 1989 සංශෝධිත තේ අලුතෙන් වගා කිරීමේ සහනාධාර ක්‍රමය යටතට පත් කෙරේ. එබැවින් එදින සිට මෙතෙක් රබර් උදුරා තේ වගා කිරීමේ ආධාර ක්‍රමය යටතේ නිකුත් කර ඇති අවසර පත්‍ර වෙනුවෙන්ද ඉහත අංක 3 සහ 4 ඡේදවල සඳහන් පරිදි සංශෝධිත ආධාර මුදල් ගෙවිය යුතුය. ඒ බව අංක 1 ඒ සහ කී උප ලේඛන පරිදි අවසර පත්‍ර හිමියන් වෙත දැනුම් දිය යුතුය.

(ආ) කලින් රබර් උදුරා තේ වගා කිරීමේ ආධාර ක්‍රමය යටතේ පස සාරවත් කිරීමේ වාරිකය වෙනුවෙන් 1989.01.01 දින හෝ ඉන්පසු කරන ලද පරීක්ෂණ සඳහා ආධාර නො ගෙවිය යුතුය. එසේ වුවද 1989.01.01 දිනෙන් පසුව පස සාරවත් කිරීමේ වාරිකය ගෙවා ඇත්නම් තේ වගා කිරීමේ වාරිකය සඳහා ගෙවීම් කරන අවස්ථාවේදී එයට හිමි රු. 19,000/= න් පස සාරවත් කිරීමට ගෙවා ඇති රු. 3,000/= මුදල අඩුකර ගෙවීම් කළයුතුය.

(ඇ) වහාම ක්‍රියාත්මක වන පරිදි රබර් X තේ ආධාර ක්‍රමය යටතේ ඉල්ලුම් පත් අවසර පත් හෝ වෙනත් ලිපි ලේඛන කිසිවක් නිකුත් නො කළ යුතු අතර, ඒ වෙනුවට අලුත් වගා ආධාර ක්‍රමයට සම්බන්ධ අනුරූප ලියකියවිලි භාවිතා කළ යුතුය.

(ඈ) ඉඩමේ රබර් වගා කර ඇති බව සඳහන් කර තිබුණද 1989 සංශෝධිත අලුත් වගා සහනාධාර ක්‍රමය යටතේ එකී ලියාපදිංචිය සහතික කරවා ගැනීම පිණිස මින් ඉදිරියට රබර් පාලක වෙත නොයැවිය යුතුය.

(ඉ) රබර් උදුරා තේ වගා කිරීමේ ආධාර ක්‍රමය යටතේ භාවිතා කරන ඔබ කාර්යාලයේ ඉතිරිව ඇති රව/6 (අවසර පත්‍රය) ආකෘති සංඛ්‍යාව දක්වමින් සතියක් ඇතුළත ප්‍රධාන කාර්යාලයට ආපසු එවිය යුතුය.

05. සංශෝධිත ආධාර මුදල පිළිබඳව පහත සඳහන් පරිදි අදාළ අවසර පත්‍ර හිමියන් වෙත දැනුම් දී ඒ බව මා වෙත වාර්තා කළ යුතුය.

(අ) තේ වගා කිරීමේ වාරිකය දක්වා (එම වාරිකයද ඇතුළුව) ගෙවීම් කිරීමට පැරණි අලුත් වගා අවසර පත්‍ර සම්බන්ධයෙන් මේ සමඟ අමුණා ඇති අංක 1ඒ උපලේඛනයද, පැරණි රබර්Xතේ අවසර පත්‍ර සම්බන්ධයෙන් මේ සමඟ අමුණා ඇති 1 බී උපලේඛනයද පරිදි සහනාධාර සංශෝධනය පිළිබඳව එකී අවසර පත්‍ර හිමියන්ට දැනුම් දිය යුතුය.

(ආ) පළමු වසර නඩත්තු කිරීමේ වාරිකයේ සිට ඉදිරියට ගෙවීම් කිරීමට ඇති අවසර පත්‍ර වෙනුවෙන් පැරණි අලුත් වගා අවසර පත්‍ර සම්බන්ධයෙන් අංක 2 ඒ උපලේඛනය ද, පැරණි රබර් X තේ අවසර පත්‍ර සම්බන්ධයෙන් අංක 2 බී උපලේඛනයද පරිදි නඩත්තු කිරීමේ වාරික ඒකාබද්ධ කොට ගෙවීම් කරන බව එකී අවසර පත්‍ර හිමියන්ට දැනුම් දිය යුතුය.

(ඇ) වහාම ක්‍රියාත්මක වන පරිදි මින් ඉදිරියට නිකුත් කරන අවසර පත්‍ර සඳහා අංක 3 උපලේඛනයේ සඳහන් පරිදි සංශෝධිත එන්. පී 7 ඒ හා බී අවසර පත්‍ර ආවරණ ලිපිය අවසර පත්‍ර හිමියන් වෙත යැවිය යුතුය.

06. අවසාන වරට අලුතින් තේ වගා කිරීමේ ආධාර මුදල් වැඩි කිරීම පිළිබඳ ව්‍යා.ව.ආ/ප්‍රති (11) සහ 1985.07.05 දිනැති ලිපියේ සහ රබර් උදුරා තේ වගා කිරීමේ ආධාර ක්‍රමය පිළිබඳව වූ 1985.04.05 දිනැති අංක 108 දරන චක්‍රලේඛ ලිපිවලින් අදාල කරුණු සම්බන්ධව දී ඇති උපදෙස් මෙම චක්‍රලේඛය අනුව නැවත සංශෝධනය කරනු ලබන බව සැලකිය යුතුය.

ඒ.කේ. නානායක්කාර
සභාපති.

පිටපත්:
1. සාමාන්‍යාධිකාරී.
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී.
3. සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්).
4. අභ්‍යන්තර විගණක.
5. ලේකම්/ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරී.
6. සියලුම කම්හල් අධිකාරීන්.
7. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්.

වගා ආධාර චක්‍රලේඛ
අංක 09 සඳහා උපලේඛනය - 1ඒ

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
.............. ප්‍රාදේශීය කාර්යාලය,
..................
1989 .............. දින.

| අවසර පත්‍ර අංකය |
|---|
| |

.........................
.........................
.........................

ප්‍රිය මහත්මයාණනි / මහත්මියනි,

අලුතෙන් තේ වගා කිරීමේ සහනාධාර ක්‍රමය යටතේ
සහනාධාර මුදල් සංශෝධනය

1989 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අලුතෙන් තේ වගා කිරීමේ සහනාධාර මුදල හෙක්ටාරයකට රුපියල් 30,000 ක් දක්වා පහත දැක්වෙන පරිදි වාරික 04 කින් ගෙවනු ලැබේ.

| | ආධාර කොටස | සංශෝධිත සහනාධාර මුදල සියලු තේ වගා දිස්ත්‍රික්ක සඳහා හෙක්ටාර් එකකට රුපියල් |
|---|---|---|
| 1. | උදුරා දැමීම | 1000 |
| 2. | පස සංරක්ෂණය කිරීම | 4000 |
| 3. | තේ වගා කිරීම | 19000 |
| 4. | පළමු වසර තුල තේ වගාව නඩත්තු කිරීම | 6000 |

02. 1989 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ඉහත වාරික යටතේ පවත්වන ගෙවීම් පරීක්ෂණ සඳහා වැඩි කරන ලද ආධාර මුදල් හිමිවන බව කරුණාවෙන් සලකන්න.

මෙයට, විශ්වාසී වූ,

ප්‍රාදේශීය කළමනාකරු.

ප්‍රි/01/04.

වගා ආධාර චක්‍රලේඛ අංක
09 සඳහා උපලේඛනය 1 බී.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය.
.................... ප්‍රාදේශීය කාර්යාලය
....................
1989 දින.

16

| අවසර පත්‍ර අංකය |
|---|
| රව/ |

..........................
..........................
..........................

ප්‍රිය මහත්මයාණෙනි / මහත්මියනි,

**රබර් උදුරා තේ වගා කිරීමේ සහනාධාර ක්‍රමය 1989 සංශෝධිත අලුතින් තේ වගාකිරීමේ සහනාධාර ක්‍රමය හා ඒකාබද්ධ කිරීම සහ සහනාධාර ප්‍රතිශෝධනය.**

1989 ජනවාරි 01 දින සිට සංශෝධිත අලුතින් තේ වගා කිරීමේ ආධාර ක්‍රමය සමග රබර් උදුරා තේ වගා කිරීමේ ආධාර ක්‍රමය ඒකාබද්ධ කිරීමටත්, හෙක්ටාර් එකකට රුපියල් 30,000/= බැගින් වන සහනාධාර මුදලක් වාරික 04 කින් ගෙවීමටත් තීරණය කොට ඇත.

02. සංශෝධිත සහනාධාර වාරික පහත දැක්වේ.

| | ආධාර කොටස | සංශෝධිත සහනාධාර මුදල සියලු තේ වගා දිස්ත්‍රික්කවල හෙක්ටාර් එකකට රුපියල් |
|---|---|---|
| 1. | උදුරා දැමීම | 1000/= |
| 2. | පස සංරක්ෂණය කිරීම | 4000/= |
| 3. | තේ වගා කිරීම | 19000/= |
| 4. | පළමු වසර තුළ තේ වගාව නඩත්තු කිරීම | 6000/= |
| | එකතුව | 30000/= |

03. 1989 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ඉහත වාරික යටතේ පවත්වන ගෙවීම් පරීක්ෂණ සඳහා සංශෝධිත ආධාර මුදල් ගෙවනු ලබන බව කරුණාවෙන් සලකන්න.

04. පසේ සාරවත් බව පිරිහී ඇති රබර් ඉඩම්වල තේ වගා කිරීමට ප්‍රථම අනුමත තණ වර්ග මාස 18 ක කාලයක් වගාකොට පස සාරවත් කිරීම ඉඩමේ කෘෂිකාර්මික අවශ්‍යතාවයක් වේ නම් එසේ කරන ලෙස ඉල්ලා සිටීමට කැමැත්තෙමි. එසේ වුවද නව සංශෝධිත සහනාධාර ක්‍රමය යටතේ 1989.01.01 දින සිට ඒ සඳහා සහනාධාර මුදලක් ගෙවනු නොලැබේ.

මෙයට, විශ්වාසී වූ,

ව ගා ආධාර චක්‍රලේඛ අංක
09 සඳහා උපලේඛනය - 2 වී

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

...............ප්‍රාදේශීය කාර්යාලය.

1989...............

| අවසර පත්‍ර අංකය |
| --- |
| අව/ |

.........................

.........................

.........................

ප්‍රිය මහත්මයාණෙනි / මහත්මියනි,

**අලුතෙන් තේ වගා කිරීමේ සහනාධාර ක්‍රමය**
**ගෙවීම් වාරික සංශෝධනය**

යථෝක්ත සහනාධාර ක්‍රමය යටතේ ආධාර මුදල් 1989 ජනවාරි 01 දින සිට සංශෝධනය කිරීම නිසා තේ වගා කිරීමෙන් පසු නඩත්තු කිරීම සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල් ඒකාබද්ධ කොට එකම වාරිකයකින් වශයෙන් ගෙවීමට තීරණය කර ඇත. එබැවින් ඔබ වෙත නිකුත් කර ඇති යථෝක්ත අංකය සහිත අවසර පත්‍රය යටතේ තේ වගාකිරීමෙන් පසු පළමු, දෙවන හා තෙවන වර්ෂවල නඩත්තු කිරීමේ වාරික වෙනුවෙන් හෙක්ටාර් එකකට රුපියල් 7500/= ක් බැගින් තේ වගා කොට වසරක් ගතවීමෙන් පසු පරීක්ෂණයකින් අනතුරුව ගෙවනු ලබන බව කරුණාවෙන් දන්වමි.

එබැවින් ඒ සඳහා තේ වගා කිරීමෙන් පසු වර්ෂයක් ගතවූ පසුව මා වෙත දැන්වීමට කටයුතු කරන්න.

මෙයට, විශ්වාසී වූ,

ප්‍රාදේශීය කළමනාකරු.

ප්‍රි/89/01/02.

වගා ආධාර චක්‍රලේඛ අංක
09 සඳහා උපලේඛනය - 2 බී.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
................ ප්‍රාදේශීය කාර්යාලය,
................
1989. දින.

**අවසර පත්‍ර අංකය**
රව/

............................
............................
............................

ප්‍රිය මහත්මයාණෙනි / මහත්මියනි,

**රබර් උදුරා තේ වගා කිරීමේ සහනාධාර ක්‍රමය 1989 සංශෝධිත අලුතින් තේ වගා කිරීමේ සහනාධාර ක්‍රමය හා ඒකාබද්ධ කිරීම සහ සහනාධාර ප්‍රතිශෝධනය.**

1989 ජනවාරි 01 දින සිට සංශෝධිත අලුතින් තේ වගා කිරීමේ ආධාර ක්‍රමය සමග රබර් උදුරා තේ වගා කිරීමේ ආධාර ක්‍රමය ඒකාබද්ධ කිරීමටත් ඒ අනුව තේ වගා කිරීමෙන් පසු නඩත්තු කිරීම සඳහා ගෙවනු ලබන සහනාධාර වාරික තුන ඒකාබද්ධ කොට එකම වාරිකයක් වශයෙන් ගෙවීමටත් තීරණය කර ඇත.

එබැවින් ඔබ වෙත නිකුත් කර ඇති යථෝක්ත අංකය සහිත අවසර පත්‍රය යටතේ තේ වගා කිරීමෙන් පසු පළමු, දෙවන හා තෙවන වර්ෂවල නඩත්තු කිරීමේ වාරික වෙනුවෙන් හෙක්ටාර් එකකට රුපියල් 9000/= ක් බැගින් තේ වගා කොට වසරක් ගතවීමෙන් පසු පරීක්ෂණයකින් අනතුරුව ගෙවනු ලබන බව කරුණාවෙන් දන්වමි.

එබැවින් ඒ සඳහා තේ වගා කිරීමෙන් පසු වර්ෂයක් ගතවූ පසුව මා වෙත දැන්වීමට කටයුතු කරන්න.

මෙයට, විශ්වාසී වූ,

ප්‍රාදේශීය කළමනාකරු.

කු/01/06.

වගා ආධාර චක්‍රලේඛ අංක 09 සඳහා

උපලේඛනය - 3

<u>ලියාපදිංචි තැපැලෙනි</u>

එන්. පී - 7. ඒ (13)

| අංකය : අව/ |
|---|

කුඩා තේ වතු සංවර්ධන අධිකාරය

.........................ප්‍රාදේශීය කාර්යාලය,

.........................................

.........................................

19..................................... දින.

......................................................මහතා / මහත්මිය,

.........................................................

.........................................................

ප්‍රිය මහත්මයාණෙනි / මහත්මියනි,

# තේ අළුතින් වගා කිරීමේ ආධාර ක්‍රමය

## ඉඩමේ නම :..........................................................

ඔබ විසින්........................ දතමින් එවා ඇති ඉල්ලුම් පත්‍රය අනුව ඉහත සඳහන් ඉඩමේ හෙක්ටාර් .................... (අක්කර.........රූඩ.........පර්:.........) ක බිම් ප්‍රමාණයක් රිකිලි තේ යොදා අළුතින් වගා කිරීම පිණිස අළුතින් වගා කිරීමේ අවසර පත්‍රයක් මේ සමග එවා ඇත. මෙම අවසර පත්‍රය යටතේ අළුතින් වගා කිරීමට අවසර දෙනලද බිම් ප්‍රමාණයෙහි ඇති ගස්/පඳුරු උදුරා දැමීම........................ .. දිනට පෙර සම්පූර්ණ කළ යුතුයි.

30000

02 තේ අලුතින් වගා කරන හෙක්ටාර් එකකට රුපියල් ~~25000~~/- ක් බැගින් වන ආධාර මුදලක් මෙම බිම් ප්‍රමාණය වෙනුවෙන් පහත සඳහන් පරිදි, කොටස් ~~හයකින්~~ ගෙවනු ලැබේ. මෙම සෑම ආධාර මුදල් කොටසක්ම ඔබට ගෙවනු ලබන්නේ අදාල වැඩ කර ඇති බව ඔබ විසින් දන්වා එවූ පසු, පරීක්ෂක නිලධාරී තැන විසින් ඉඩම පරීක්ෂා කළාට පසුවය.

(1) හෙක්ටාර් එකකට රුපියල් 1000/- ක් බැගින් වන පළමුවැනි කොටස, බිම් ප්‍රමාණයේ උදුරා ඉවත්කිරීම කටයුතු සම්පූර්ණ කළායින් පසුව ගෙවනු ලැබේ. ආධාර මුදලේ පළමුවැනි කොටස ගෙවීමට පෙර, ඉඩමෙහි තිබෙන අතුරු වගාවන්ද උදුරා ඉවත් කළ යුතුයි. (කොස්, දෙල්, පොල් වැනි උදුරා දැමීමට අදහස් නොකරන ගස් වර්ග ඇතිවිට පරීක්ෂක නිලධාරී තැනගේ නිර්දේශ අනුව බිම් ප්‍රමාණයක් අඩු කරනු ඇත.)

(2) හෙක්ටාර් එකකට රුපියල් 4000/- ක් බැගින් වන දෙවන කොටස, අළුතින් වගා කිරීමට තිබෙන බිම් ප්‍රමාණයේ අවගාහ පස සංරක්ෂණ කටයුතු සම්පූර්ණ කළායින් පසු ගෙවනු ලැබේ.

19000

(3) හෙක්ටාර් එකකට රුපියල් ~~12500~~/- ක් බැගින් වන තුන්වැනි කොටස ලියාපදිංචි කරන ලද තේ තවානකින් හෝ ඔබ විසින් පිළියෙල කරගත් තවානකින් ලබාගත් අනුමත ක්ලෝන්වල රිකිලි තේ පැල අඩු තරමින් හෙක්ටාර් එකකට රු: 11120/- (අක්කරයකට 4500) ක් යොදා ඉඩම අලුතින් වගාකර අවසාන වූවායින් පසු ගෙවනු ලැබේ. (තමන්ගේම තේ තවානක් පිහිටුවීමට අදහස් කරන්නෝ නම් ලියාපදිංචි කරන ලද තේ වත්තකින් සුදුසු ක්ලෝන් වර්ගයක තේ රිකිලි ලබාගත යුතු අතර ඒවා පොලිතින් බෑග්වල පැලකල යුතුය.)

වැදගත් : කුමන හේතුවක් නිසාවත් ටී ආර් අයි 2023 ක්ලෝනය පහතරට ප්‍රදේශවල වගා නොකළ යුතුය.

6000

(4) හෙක්ටාර් එකකට රුපියල් ~~4500~~/- ක් බැගින් වන හතරවන කොටස, ඉඩම අළුතින් වගාකර අවසානවීමෙන් අවුරුදු එකක් ගතවූවායින් පසු වගාව සතුටුදායක පරිදි පවත්වාගෙන අවුත් තිබේ නම්, පමණක් ගෙවනු ලැබේ.

(අ. පී. බ.)

මෙ තැනින් වෙන් කරන්න

---

එන් පී 7 බී

<u>ප්‍රකාශනය</u>

ප්‍රාදේශීය කළමනාකරු,
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
ප්‍රාදේශීය කර්යාලය.
... .........................

.........................................

දිනය...................................

## <u>තේ අළුතින් වගා කිරීමේ ආධාර ක්‍රමය</u>

අවසර පත්‍ර අංකය :..........................................

<u>ඉඩමේ නම :..........................................</u>

ඔබ විසින් මා / අප නමට නිකුත් කරන ලද.............................. දින හා අංක අව/.................... .. දරණ තේ අළුතින් වගා කිරීමේ අවසර පත්‍රය අනුව හෙක්ටාර්............................(අක් :.........රූඩ.........පර් .........) ක අළුත් වගා කටයුතු ඔබගේ................................................ දින දරණ ලිපියේ සඳහන් කොන්දේසි වලට අනුව නිම කිරීමට මම / අපි එකඟ බව මෙයින් ප්‍රකාශ කරමි / කරමු.

~~(5) හෙක්ටයාර් එකකට රුපියල් 2500/- ක් බැගින් වන පස්වැනි කොටස, ඉඩම අළුතින් වගාකර අවසාන වීමෙන් අවුරුදු දෙකක් සම්පූර්ණ වූවායින් පසු, වගාව සතුටුදායක පරිදි පවත්වාගෙන අවුත් තිබේ නම්, පමණක් ගෙවනු ලැබේ.~~

~~(6) හෙක්ටයාර් එකකට රුපියල් 2500/- ක් බැගින් වන හයවන කොටස, ඉඩම අළුතින් වගාකර අවසාන වීමෙන් අවුරුදු තුනක් සම්පූර්ණ වූවායින් පසු, වගාව සතුටුදායක පරිදි පවත්වාගෙන අවුත් තිබේ නම්, පමණක් ගෙවනු ලැබේ.~~

03. පළමුවෙනි ආධාර මුදල් කොටස ගෙවීම සඳහා ඉඩම පරීක්ෂා කිරීමට පෙර, අළුතින් වගා කිරීමට තිබෙන බිම් ප්‍රමාණයේ මිනින්දෝරු සැලැස්මක් මා වෙත එවීම අවශ්‍ය වේ. වර්ෂ 1925 ට පසුව පිළියෙල කරන ලද වත්තේ මිනින්දෝරු සැලැස්මක් තිබේ නම්, වත්තේ අළුතින් වගා කිරීමට ඇති බිම් ප්‍රමාණය එම වත්තේම පිහිටි බිම් කට්ටියක් වශයෙන් පැහැදිලිව පෙන්නුම් කර ඇත්නම්, බලය ලත් මිනින්දෝරු කෙනෙකු විසින් එම සැලැස්මෙහි ලකුණු කිරීමට සහතික කර එවන පිටපතක් වුවද පිළිගනු ලැබේ. අළුතින් වගා කිරීම සඳහා අවසර දෙන ලද බිම් ප්‍රමාණය අක්කරයෙන් හෝ ඊට අඩුනම්, පරීක්ෂණය පැවැත්වීම සඳහා, සාමාන්‍යයෙන් බිම් ප්‍රමාණයේ සැලැස්ම අවශ්‍ය නොවේ.

04. සම්මත දරණ අවසර පත්‍රය යටතේ කිසියම් ආධාර මුදල් කොටසක් හෝ කොටස් ගණනක් ලබාගත් පසු, අවසාන ආධාර මුදල් කොටස දක්වා අවශ්‍ය යෙසු වගා වැඩ කොටස් මෙහි සඳහන් කොන්දේසි අනුව සහ නියමිත කාලසීමාවන් තුළදී නිම නොකළහොත් ඔබ විසින් මෙම අවසර පත්‍රය අනුව, ලබා ඇති සම්පූර්ණ ආධාර මුදල් මා වෙත ගෙවිය යුතු බවද දන්වමි.

04. මෙම අවසර පත්‍රය යටතේ කිසියම් ආධාර මුදල් කොටසක් හෝ කොටස් කීපයක් ලබාගැනීමෙන් පසු නියමිත අන්දමට වගා වැඩ සම්පූර්ණ කිරීමට පෙර අවසර පත්‍රය යටතේ බලය දී ඇති බිම් ප්‍රමාණය හෝ ඉන් කොටසක් හෝ අන්සතු කිරීමට පෙර, අවසර පත්‍රය අනුව වගා වැඩ සියල්ල නියමිත කාලසීමාවන් තුළදී මෙම අධිකාරියේ කොන්දේසි අනුව නිමකරන බවට ගැනුම්කරුගෙන් / කාරියගෙන් ප්‍රකාශනයක් ලබාගෙන අධිකාරියට ඉදිරිපත් කළ යුතුවේ. එසේ නොකළොත් ඉඩම අන්සතු කිරීමේ අවස්ථාව දන්වා මෙම අවසර පත්‍රය යටතේ ලබාගෙන ඇති සම්පූර්ණ ආධාර මුදල් ඉඩම අන්සතු කිරීමට පෙර මා වෙත ගෙවීමට බැඳී සිටින බව සැළකිය යුතුවේ.

06. ඉහත සඳහන් කොන්දේසි යටතේ සම්ංක දරණ අවසර පත්‍රය අනුව, අළුතින් වගා කිරීමට එකඟ බවට අමුණා ඇති ප්‍රකාශනය සම්පූර්ණ කර මා වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ප්‍රකාශනය මා වෙත එවනතුරු ආධාර මුදල් ගෙවීම කරනු නොලැබේ.

| |
|---|
| මෙම අවසර පත්‍රය යටතේ ඔබට හිමිවන මුළු මුදල රුපියල්: |

මෙයට, විශ්වාසවූ,

ප්‍රාදේශීය කළමනාකරු.

වැදගත් : හෙක්ටයාර් එකක් අක්කර 2.4711 ක් ලෙස සැලකේ.